# තොරතුරු පත්‍රිකාව - ලෝක ආඝාත දිනය - 2023

හැඳින්වීම

මස්තිෂ්ක වාහිනී රෝගය ආඝාතය ලෙස ද හැඳින්වෙන අතර, එය ලොව පුරා මරණ සහ ආබාධිත වීම සඳහා බලපාන ප්‍රධාන හේතුවක් වේ. වයස අවු. 25 ට වැඩි වැඩිහිටියන් සිව් දෙනෙකුගෙන් එක් අයෙකුට ජීවිත කාලය පුරාවටම ආඝාතය වැළදීමේ අවදානමක් ඇත. සෑම වර්ෂයකදීම, ලොවපුරා මිලියන 12 ක ජනතාවකට ආඝාතය වැළඳේ. මෙහිදී, වඩාත් කැපී පෙනෙන ලක්ෂණය වන්නේ, පහළ ආදායම් ලබන රටවල් සහ ශ්‍රී ලංකාව වැනි පහළ - මධ්‍යම මට්ටමේ ආදායම් ලබන රටවල් සහ ගෝලීය ආඝාත රෝගී ගැටළුකාරී තත්ත්වය වැඩි / විශාල වශයෙන් (ආඝාතය නිසා 86% මරණ සංඛ්‍යාවක් සිදුවන අතර 89% ක් වේ.)

පසුගිය වසර 10 ක කාලය පුරා ශ්‍රී ලංකාවේ රජයේ රෝහල් වලට ඇතුළත් කළ ආඝාත රෝගීන්ගේ සංඛ්‍යාව දෙගුණයක් වී ඇත අතර වාර්ෂිකව 60,000 ට ආසන්න රෝගීන් සංඛ්‍යාවක් රෝහල්ගත කෙරේ. කෙසේ වෙතත් රෝහල් මරණ සඳහා තෙවැනි ප්‍රධාන හේතුව ලෙස නම් කර ඇති ආඝාතය මේ වන විට පස්වන ස්ථානයට පත්ව ඇත. මින් අදහස් වන්නේ ආඝාතය පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය වැඩිවී ඇති බවත් රෝගීයාව හැකි ඉක්මනින් රෝහලට ඇතුළත් කරුණු ලැබුවහොත් ආඝාත රෝගී තත්ත්වයට ප්‍රතිකාර කළහැකි බවත්ය. ලෝක ආඝාත සංවිධානය මඟින් ලෝක ආඝාත දිනය ප්‍රකාශයට පත්කර ඇති අතර ආඝාත රෝගයේ බරපතළ ස්වභාවය සහ රෝගය වැළඳීමෙ ඉහළ අනුපාතයන් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම, රෝග නිවාරණය සහ ප්‍රතිකාර කිරීම, සහ රෝගයෙන් බේරී සිටින පුද්ගලයින් වඩා යහපත් රැකවරණයක් සහ සහයෝගය ලබා දීමත් තහවුරු කිරීමේ අරමුණින් සෑම වසරකම ඔක්තෝබර් මස 29 වන දින මෙම දිනය සමරනු ලැබේ. මෙම දිනය සැමරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝනොවන රෝග අධ්‍යක්ෂක මණ්ඩලය, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකාවේ ජාතික ආඝාත සංගමය සමඟ සහයෝගීව කටයුතු කරනු ලැබේ.

තේමාව - 2023 (2023 වර්ෂයේ සඳහා වන තේමාව)

ආඝාතයට වඩා නිවාරණ සංඛ්‍යාව ශ්‍රේෂ්ඨයි.

විශේෂයෙන්ම පහළ සහ පහළ-මධ්‍යම මට්ටමේ ආදායම් ලබන රටවලට එමගින් එල්ල වන ප්‍රධාන ආර්ථික හා සාමාජීය බලපෑම සැලකිල්ලට ගෙන ආඝාතය ප්‍රාථමිකව නිවාරණය කිරීම කෙරෙහි මෙම වර්ෂයේ ලෝක ආඝාත දින තේමාව මඟින් අවධානය යොමු කෙරේ. 2023 වර්ෂයේදී ලෝක ආඝාත ව්‍යාපාර මඟින් ආඝතයට වඩා අපට ශ්‍රේෂ්ඨ විය හැකි ආකාරය පිළිබඳව ඉදිරිපත් කෙරේ.

එසේම, මෙම රෝගය සඳහා බලපාන කුඩාතර අවදානම් සංඛ්‍යාවක් පිළිබඳව අවධානය යොමු කිරීමෙන් ආඝාතයෙන් 90% ක් වළක්වා ගත හැකිය. අප එක් එක් පුද්ගලයාගේ ආඝාත අවදානම අඩුකර ගැනීම සඳහා ක්‍රියාකළ හැකි පියවර අප සෑම කෙනෙකුටම ගත හැකිය. තවද, අප සෑම එක්ව ශ්‍රී ලංකාවේ සහ ලොව පුරා ආඝාත රෝගයේ පීඩාකාරී තත්ත්වය අඩුකරලීමට කටයුතු කළ හැකිය. ඒසේම, රෝග නිවාරණය, රෝගය සුවපත් කරනවාට වඩා යහපත් වන අතර ආඝාතයට වඩා

ආඝාතය එහි මුල් අවස්ථාවේදීම කළමනාකරණය කිරීම සහ නිවාරණය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රියාකාරකම් රැසක් ආරම්භ කර ඇත.

- බොහෝ ප්‍රාදේශීය රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානවල ස්ථාපිත කර ඇති සුවදිවි මධ්‍යස්ථාන මඟින්සිදුකරන සාමාන්‍ය රෝග පරීක්ෂා කිරීම ඇතුළු ආඝාතය සඳහා බලපාන අවදානම් සාධක පාලනය කිරීම සහනිවාරණය කිරීම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ සහ ඔවුන් වෙනුවෙන් නොමිළයේ රෝග පරීක්ෂා කිරීමේ කටයුතු වලදී බෝනොවන රෝග අධ්‍යක්ෂ කාර්යාලය ක්‍රියාකාරීව මැදිහත් වේ. මෙහිදී වඩාත් කැපී පෙනෙන ලක්ෂණය වන්නේ, ගෝලීය ආඝාත රෝගී පීඩාකාරී තත්වය වැඩි වශයෙන් (මරණ වලින් 86% ක් ආඝාතය නිසා සිදුවන අතර 89% ක් DALYs නිසා වේ) දක්නට ලැබෙන්නේ පහළ ආදායම් ලබන රටවල් සහ පහළ-මධ්‍යම ආදායම් ලබන ශ්‍රී ලංකාව වැනි රටවල වීමය.

- ඉහළ පුහුණුවකින් යුත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක ප්‍රධානත්වයෙන් රටේ සියළුම ප්‍රධාන රෝහල්වල විශේෂිත ස්නායුවෛදීය ඒකක පිහිටුවා ඇත.රටේ දිස්ත්‍රික්ක 25 ම පාහේ පිහිටුවා ඇති "ආඝාතය සඳහා සූදානම්"රෝහල් 31 ක් හරහා මේ වනවිට ආඝාතය සඳහා හේතුවන ලේ කැටි දියකර හැරීමේ (stroke thrombolysis) සේවාවන්ආවරණය කරනු ලැබේ. නිතිපතා යාවත්කාලීන වන සිතියමක් මඟින් අදාළ සේවාවන් සපයන ස්ථාන පිළිබඳවwww.asn.lkවෙබ් අඩවියේ දැක්වේ.කෙසේ වෙතත්, රටේ දිස්ත්‍රික්ක 10 ක පමණක් ආඝාත ඒකක පිහිටා ඇති අතර රෝගීන්ගෙන් 15% ක ප්‍රතිශතයකට පමණක් ආඝාත ඒකකයක සේවාවන් ලබාගැනීම සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ඇත.මෙම ගැටළුව විසඳීමටත් ආඝාත ඒකක වෙතින් සේවාවන් ලබාගැනීම සඳහා ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම සඳහාත් වැඩසටහන් ක්‍රියාවට නංවා ඇත.

- ආඝාතය හඟවන රෝග ලක්ෂණ පෙන්නුම් කරන විටෙකදී, 1990 හෝ 1990 සුහුරු ජංගම දුරකතන යෙදවුම (smart phone application) භාවිතයෙන් ශ්‍රී ලාංකීය ජනතාවට "සුවසැරිය" ගිලන් රථ සේවාව නොමිළයේ ලබාගත හැකිය. සුදුසු "ආඝාතය සඳහා සූදානම්" රෝහල් වෙත ආඝාත රෝගීන් කඩිනමින් මාරු කර යැවීමට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා ජාතික ආඝාත සංගමය"සුවසැරිය" ගිලන් රථ සේවාව සමඟ සහයෝගීව කටයුතු කර ඇත. ඊට අමතරව, ශ්‍රී ලංකා ජාතික ආඝාත සංගමය, ශ්‍රී ලංකීය ස්නායුවෛදීන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා හදිසි කායික රෝග වෛද්‍ය විද්‍යාෘයතනය සමඟ සහයෝගීත්වයෙන් ආඝාතය රෝග නිවාරණ කටයුතු සම්බන්ධව EMTs සඳහා පුහුණු වැඩසටහන් සකස් කෙරේ.

- ශ්‍රී ලංකා ජාතික ආඝාත සංගමය, ශ්‍රී ලංකීය ස්නායුවෛදීන්ගේ සංගමය සමඟ එක්ව ආඝාත රෝගීන් පිළිබඳ දැනුවත්භාවයසහ එම රෝගීන්හට සත්කාර කිරීමේ කටයුතු ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. සංගමය විසින් "FAST" ආඝාතය හඳුනාගැනීම සහ නිවාරණය සම්බන්ධ

ත්‍රෛභාෂික අධ්‍යාපන වීඩියෝ පණිවුඩ සකස් කර ඇති අතර එම වීඩියෝ පණිවුඩwww.stroke.lkවෙබ් අඩවිය තුළින් නැරඹිය හැකිය.බෝනොවන රෝග අධ්‍යක්ෂ කාර්යාලය, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකාවේ කාර්යාලය සමඟ සහයෝගීත්වයෙන් මහජනතාවට භාවිතා කිරීම සඳහා ඉදිරිපත් කිරීම් (presentation slides) (සිංහල හා දෙමළ මාධ්‍ය) සහ ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකරන ලදී.

- රටේ වැඩි වශයෙන් ආඝාත ඒකක ස්ථාපිත කිරීමට අවශ්‍ය අරමුදල් රැස්කිරීම සඳහා 2023 ඔක්තෝම්බර් මස 25 දින ආඝාත පා ගමනක් පැවැත්වනු ලැබේ.